දේශගුණ විපර්යාස ඇතිවීම වළක්වා ගනිමු

වර්තමානයේ අප මුහුණ දී ඇති දේශගුණ විපර්යාසයන්ට ප්‍රධාන හේතුව මානව ක්‍රියාකරකම් හේතුවෙන් සීඝ්‍ර ලෙස වායුගෝලයට එකතුවන හරිතාගාර වායු වේ.

ප්‍රධාන හරිතාගාර වායු

- කාබන් ඩයොක්සයිඩ් (CO_2),
- නයිට්‍රස් ඔක්සයිඩ් (N_2O),
- හයිඩ්‍රොෆ්ලෝරෝ කාබන් (HFC),
- ක්ලෝරෝෆ්ලෝරෝ කාබන් (CFC),
- සල්ෆර් හෙක්සාෆ්ලෝරයිඩ් (SF_6)
- මීතේන් (CH_4),
- ඕසෝන් (O_3),
- ජල වාෂ්ප

වායුගෝලයේ හරිතාගාර වායු සාන්ද්‍රණය සීඝ්‍ර ලෙස ඉහල යාමට හේතු

- කාර්මීකරණයත් සමග අධික ලෙස පොසිල ඉන්ධන දහනය වැඩිවීම

- ආර්ථික සංවර්ධන කටයුතු සඳහා ඉඩම් පරිහරණ රටාව වෙනස්වීමෙන් වනගහනය අඩුවී ශාක මගින් හරිතාගාර වායු උරාගැනීම අඩුවීම

ශ්‍රී ලංකාවේ දේශගුණ වෙනස්කම්

උෂ්ණත්වය ඉහළයාම

පසුගිය වසර 40 ක කාලය තුල ශ්‍රී ලංකාවේ නුවරඑළිය රත්නපුර යන ස්ථානවල හැර අනෙකුත් ස්ථානවල සෙල්සියස් 0.046 කින් උෂ්ණත්වය ඉහලයාමේ ප්‍රවනතාවක් නිරීක්ෂණය කර ඇත.

වර්ෂාපතනය අඩුවීම

1961- 2000 අතර කාලය තුල ශ්‍රී ලංකාවේ වර්ෂාපතනය වසරකට මිමි 9.46 කින් අඩුවීමේ ප්‍රවනතාවක් දක්නට ඇත.

දේශගුණ විපර්යාස හේතුවෙන් අප මුහුණ දී ඇති ගැටළු

වර්ෂාපතන රටාව වෙනස්වීම තුලින් නියඟයන් හා ගංවතුර තත්වයන් ඇතිවීම, කෘෂි කර්මාන්තයට හානි වීම, යටිතල පහසුකම් විනාශ වීම.

අධික සීඝ්‍රතාවයෙන් යුත් වැසි වැඩිවීම නිසා පාංශු ඛාදනය, කඳුකර ප්‍රදේශ නායයෑම් වේගවත්වීම.

බෝවන රෝග ව්‍යාප්තිය වැඩිවීම.

ජෛව විවිධත්ව හායනය.

සාගර ජල මට්ටම ඉහළ යාම නිසා වෙරළ ඛාදනය, කරදිය මිරිදියට මිශ්‍රවීම, වෙරළාශ්‍රිත ජල ගැලීම් ඇතිවීම,වෙරළාශ්‍රිත පරිසර පද්ධතීන් විනාශ වීම.

දේශගුණ විපර්යාස අවම කිරීමට අපට කළ හැකි දේ

පොසිල ඉන්ධන භාවිතය වෙනුවට විකල්ප බලශක්ති ප්‍රභවයන් භාවිතා කිරීමට හුරුවෙමු.

බයිසිකලය පාවිච්චියට පුරුදුවෙමු.

වැඩි වැඩියෙන් රුක් රෝපණය කරමු.

සරල දිවිපෙවෙතකට හුරුවෙමු.

කසල ජනනය අවම කිරීම හා ප්‍රතිචක්‍රීකරණය කරමු.

පරිසර හිතකාමී නිෂ්පාදන හා පරිභෝජන රටාවකට හුරුවෙමු.

පොදු ප්‍රවාහනයට හුරුවෙමු.

බලශක්ති කාර්යක්ෂමතාව වැඩි කරමු.

පරිසර හිතකාමී ගොඩනැගිලි නිර්මාණය කරමු.

අඩු බලශක්තියක් වැයවන විදුලි බුබුළු භාවිතා කරමු.

පරිසර අමාත්‍යාංශය

දේශගුණ විපර්යාස අංශය